මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| **නිකුත් කළේ** | රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2023 පෙබරවාරි 01 |

**2023 පෙබරවාරි 01 දින පවත්වන ලද භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිය**

| **කල්පිරීම** (දින) | **ඉදිරිපත් කළ ප්‍රමාණය** | **ලැබුණු ලංසු ප්‍රමාණය** | **පිළිගත් ලංසු ප්‍රමාණය(අ)** | **බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%)** | |
|---|---|---|---|---|---|
| | | | | **මෙම වෙන්දේසිය** | **පසුගිය වෙන්දේසිය** |
| **91**<br>LKA09123E050 | 60,000 | 119,554 | 30,180 | **29.91** | 29.91 |
| **182**<br>LKA18223H043 | 30,000 | 48,667 | 5,110 | **28.72** | 28.72 |
| **364**<br>LKA36424B022 | 30,000 | 36,618 | 10,316 | **27.72** | 27.78 |
| **එකතුව** | **120,000** | **204,839** | **45,606** | | |

*සියලුම වටිනාකම් රු. මිලියන වලින් වේ.*

**(අ) ගෙවීම් කළ යුතු දිනය: 2023 පෙබරවාරි 03**

**අදියර II යටතේ සු.හ.ජා. අංක LKA09123E050, LKA18223H043 සහ LKA36424B022 සඳහා ඉහත වෙන්දේසියේදී තීරණය වූ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතික යටතේ ලංසු ඉදිරිපත් කිරීම වෙන්දේසියේ ගෙවීම් කළ යුතු දිනයට පෙර ව්‍යාපාරික දිනයේ (එනම්, 2023.02.02) ප.ව. 3.30 දක්වා සිදු කල හැක**. අදියර II හිදී, ඉහත සු.හ.ජා. අංක යටතේ ඉදිරිපත් කරනු ලබන සමස්ත මුදල වනුයේ, වෙන්දේසියේදී පිළිගත් මුදල හා වෙන්දේසිය සඳහා ඉදිරිපත් කරන ලද මුදල අතර වෙනස සහ වෙන්දේසියේ දී පිරිනමන ලද සමස්ත මුදලින් 25%කි.

අදියර II සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රමාණය අභිබවා ලංසු ලැබුනහොත්, වෙන්දේසියට සහභාගී වූ පාර්ශ්වයන්ගේ සමස්ත සාර්ථකත්වයට සමානුපාතිකව වෙන් කිරීම් සිදු කරනු ඇත.

අදියර II සඳහා ඉදිරිපත් කරන ඕනෑම ලංසුවක්, බලයලත් ප්‍රාථමික අලෙවිකරුවෙකු හරහා නියමිත කාලසීමාව තුළ **fopdd@cbsl.lk** යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතු ය. ප්‍රාථමික වෙන්දේසියේදී ලංසුවක් සඳහා අවශ්‍ය වන අවම මුදල, අදියර II සඳහා ද අදාළ වේ.